# හීන හොඳ ගොවිරාළ



ඉනුෂි නෙත්සරා පීරිස්

කෘතියේ නම : හිත හොඳ ගොවිරාළ.

2025

කතෘ ප්‍රකාශනයකි.

ISBN: 978-624-208-740-5



කථාව සහ චිත්‍ර - ඉනුෂි නෙත්සරා පීරිස්.

පාසල - මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර.

කර්තෘගේ වෙනත් කෘති: පුංචි යාළුවෝ.

ඉගෙනුම ලබන පංතිය 3 වසර B

කෘතිය ප්‍රකාශිත දිනය: 2025.02.08

# පිදුම

කුඩාකල සිට අකුරු කියාදුන්

සියලුම ගුරුවරුන්ට සහ පියවරුන්ටත්

මාගේ දෙමව්පියන්ටත්

මෙම පොත ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහා සයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සා හිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර් පාසල් ප්‍රජාවම ආදි කර්තෘකරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදායම රට තුළ යළි ගො ඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යො මු කරන හෙරණගත්කරණි ව්‍යාපෘතිය හඳුන්වාදෙන්නට විය. මෙම ශා ස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනියෙන් මාහට අබිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය ,

ශෂිකලා සේනාදීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කුඩාගමක දුප්පත් ගොවිරාළ කෙනෙකුට ලස්සන ගොවිපොලක් තිබුනා.

ගොවිරාළ ඉතාමත් මහන්සියෙන් ගොවිතැන් කරගෙන ජීවත් වුණා.



එක දවසක් මේ ගොවිපොළේ හොඳින් වැඩුණු වට්ටක්කා වැලක විශාල වට්ටක්කා ගෙඩියක් හැදුනා.

මේ වට්ටක්කා ගෙඩිය දැකපු හැමෝම පුදුමයට පත්වුනා.



ගොවිරාල මේ ලොකු වට්ටක්කාගෙඩිය  ගමේ හැමෝත් එක්කම බෙදාගත්තා.

ගමේ මිනිස්සු ගොඩක් සතුටු වුනා.

ගමරාළට ස්තුති කළා.



ගමේ මිනිසුන් හැම දෙනාම  ගමරාළට වගා කරන්න උදව් කළා

හැමෝම හරි කැමැත්තෙන් ගමරාළගේ ගොවිපොළේ වැඩ කරා.

ගමේ මිනිස්සුන්ගේ උදව්වෙන් මේ ගොවිරාල තමන්ගෙ ගොවිපොළේ සියලු එළවලු පලතුරු වගාකළා. ලොකු ලාභයක් ලබාගත්තා.





ගොවිරාළ ගමේ හැමෝටම උදව් කරා.

සියලු අස්වැන්න ගමේ මිනිසුන් සමග බෙදා ගෙන පරිභෝජනය කරන්න දුප්පත් ගොවිරාළ පුරුදු වෙලා හිටියා.

මේ නිසා ගොවිරාළ හැම තැනම ප්‍රසිද්ධ වුණා.



රටේ හැම ප්‍රදේශයකින්ම ගොවිපොළ බලන්න මිනිස්සුන් ආවා .

ගොවිරාළට හරිම සතුටුයි.

ඔක්කොම එළවලු පලතුරු ටික විකිණුනා.





ඒ රටේ රජ්ජුරුවන්ටත් මේ බව ආරංචි වුණා.

රජතුමා රාජපුරුෂයන් දෙන්නෙක් යවලා ඒ ගොවිරාළව රාජ මාලිගයට ගෙන්වාගත්තා.



හරි සතුටින් ගොවියාව අගය කරා.
මිල මුදල් රන්කාසි දීල සංග්‍රහ කරා.

හැමෝම සතුටින් ජීවත් වුණා.



# පසුවදන.



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් ගත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙසේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප , පළාත් , ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායාබාලිකාවිද්‍යාලයේ විදුහල්පති තුමිය , දියණියන් , ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකියි මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේ පාසැල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායාබාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගාදී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචිගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාශින්සන.

ව්‍යාපෘති නිර්මාතෘසම්බන්ධීකාරක ,

සෙනවිරත්න මහලේකම්.